JMC vLearning
"your virtual learning partner"

# ගිණුම්කරණ සමීකරණ, ද්විත්ව සටහන් න්‍යාය සහ ගිණුම්කරණ සංකල්ප 01 කොටස

## AAT අදියර I

FAC - මූල්‍ය ගිණුම්කරණය


සංදීප ජයසේකර
MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917


JMC vLearning
"your virtual learning partner"

# AAT 01 – මූල්‍ය ගිණුම්කරණය

## පරිච්ඡේදය - 02 ගිණුම්කරණ සමීකරණ, ද්විත්ව සටහන් න්‍යාය සහ ගිණුම්කරණ සංකල්ප

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University





JMC vLearning "your virtual learning partner"


ව්‍යාපාර ඒකක
සංකල්පය
JMC Jayasekera Management Centre (Pvt) Ltd


ව්‍යාපාර ඒකක සංකල්පය
Hot dog
Hot dog
ව්‍යාපාරය
එහි අයිතිකරුවාගෙන්
වෙන් වූ
ස්වාධීන ඒකකයකි.
JMC Jayasekera Management Centre (Pvt) Ltd


මූල්‍ය ප්‍රකාශන මූලිකාංග


මූල්‍ය ප්‍රකාශන මූලිකාංග
වත්කම්
වගකීම්
හිමිකම්
ආදායම්
වියදම්
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
මූල්‍ය තත්ත්වය
ලාභාලාභ ගිණුම
මූල්‍ය ප්‍රගතිය

## 2019 ජනවාරි 1.5

ආදායම් ප්‍රකාශය තුල ඇතුලත්වන මූලිකාංග මොනවාද?

1. වත්කම් සහ වගකීම්
2. වගකීම් සහ ආදායම්
3. වියදම් සහ හිමිකම්
4. ආදායම් සහ වියදම්



## වත්කමක් යනු

අතීත ගණුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ව්‍යාපාරය විසින් පාලනය කරනු ලබන වර්තමාන ආර්ථික සම්පත්.



JMC vLearning
"your digital learning partner"

## 2024 ජනවාරි 1.1

අතීත ගණුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ව්‍යාපාරයේ පාලනය තුල පවතින වර්තමාන ආර්ථික සම්පත් යනු,

1. හිමිකම් 2. වගකීම් 3. වත්කම් 4. ආදායම්




## වත්කමක ලක්ෂණ

| අයිතිය | ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට ඇති හැකියාව | පාලනය |
|---|---|---|
| මුදල් ලැබීමට, භාණ්ඩ හා සේවා ලැබීමට, සම්පත් හුවමාරුවට, දේපළ පිරියත සහ උපකරණ භාවිතයට ඇති අයිතිය. | මුදල් සහ අනිකුත් වත්කම් ව්‍යාපාරයට ජනනය කිරීමට ඇති හැකියාව | ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට ඇති හැකියාව. පිරිවැය හෝ වටිනාකම විශ්වසනීයව මැනීමට ඇති හැකියාව |

**හදුනාගැනීම් නිර්ණායක**

- ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට ඇති හැකියාව
- පිරිවැය හෝ වටිනාකම විශ්වසනීයව මැනීමට ඇති හැකියාව

JMC vLearning "your virtual learning partner"




## 2024 ජනවාරි 1.18

**ජංගම නොවන වත්කම් සඳහා උදාහරණ 02 ක් දෙන්න.**



JMC vLearning "your virtual learning partner"

# වගකීමක් යනු

අතීත ගණුදෙනුවක හෝ සිදුවීමක
ප්‍රතිඵලයක් ලෙස ඇතිවුණ
ආර්ථික සම්පත් පවරාදීම සම්බන්ධයෙන්
ව්‍යාපාරයට ඇති වර්තමාන බැඳීම.

Sandeepa Jayasekera - JMC 13

JMC vLearning
"your virtual learning partner"

# වගකීමක් වීමට නම් තිබිය යුතු දේ.

| අතීත සිදුවීම් | වර්තමාන බැඳීම | ආර්ථික සම්පත් ව්‍යාපාරයෙන් බැහැරට ගලා යාම |
|---|---|---|







## 2020 ජනවාරි 1.14

පහත ප්‍රකාශය හරිද වැරදිද යන්න දක්වන්න.

ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඇති හැකියාව වගකීමක ලක්ෂණයකි.



## වගකීම් වර්ගීකරණය

**ජංගම නොවන වගකීම් (> මාස 12)**

- බැංකු ණය
- උකස් ණය
- ණයකර
- කල්බදු
- වරණීය කොටස්

**ජංගම වගකීම් (< මාස 12)**


- ණයහිමියන්
- වෙනත් ගෙවිය යුතු
- උපචිත වියදම්
- ගෙවිය යුතු බදු
- බැංකු අයිරාව




JMC vLearning
"your virtual learning partner"


හිමිකම් යනු
වත්කම් වලින් අඩුකළ පසු ඉතිරි වටිනාකම
වත්කම්
(-)
වගකීම්
Sandeepa Jayasekera - JMC



මූලික ගිණුම්කරණ සමීකරණය
Sandeepa Jayasekera - JMC


මූලික ගිණුම්කරණ සමීකරණය
වත්කම්
=
හිමිකම්
+
වගකීම්
සම්පත්වල කර තිබෙන ආයෝජන
=
ව්‍යාපාරයට සැපයූ මූල්‍ය වෙනුවෙන් අයිතිකරුට ගෙවීමට ඇති බැඳීම
+
ව්‍යාපාරයට සැපයූ මූල්‍ය වෙනුවෙන් බාහිර පාර්ශවයන්ට ගෙවීමට ඇති බැඳීම
ආයෝජන
=
මූල්‍ය
Sandeepa Jayasekera - JMC
19


START
ව්‍යාපාරයක් ආරම්භ කරන අවස්ථාවේදී
හිමිකම්
=
වගකීම්

## රු. මිලියන 5 ක් ආයෝජනය කරමින් මනෝජ් විසින් ITEC ව්‍යාපාරය ආරම්භ කරන ලදී.

| වත්කම් | = | හිමිකම් |
|---|---|---|
| මුදල් රු. 5,000,000/= | = | හිමිකම් ප්‍රාග්ධනය රු. 5,000,000/= |



=





JMC vLearning your virtual learning partner

## ITEC ව්‍යාපාරය විසින් රු. 2,500,000 ක ගොඩනැගිල්ලක් මිලදී ගන්නා ලදී.

| වත්කම් | = | හිමිකම් |
|---|---|---|
| ගොඩනැගිල්ල රු. 2,500,000 | = | හිමිකම් ප්‍රාග්ධනය රු. 5,000,000 |
| මුදල් රු. 2,500,000 | | |

## ITEC ව්‍යාපාරය රු. 2,000,000 ක් වටිනා පරිගණක මිලදී ගන්නා ලදී

| වත්කම් | = | හිමිකම් |
|---|---|---|
| ගොඩනැගිල්ල රු. 2,500,000<br>තොගය රු. 2,000,000<br>මුදල් රු. 500,000 | = | හිමිකම් ප්‍රාග්ධනය<br>රු. 5,000,000 |



JMC vLearning
"your virtual learning partner"

## ITEC විසින් රු. 2,000,000 පිරිවැය වූ පරිගණක තොගයක් රු. 3,000,000 කට විකුණා රු. 1,000,000 ක් ලාභයක් ලබන ලදී.


| වත්කම් | = | හිමිකම් |
|---|---|---|
| ගොඩනැගිල්ල රු. 2,500,000<br>තොගය රු. 0<br>මුදල් රු. 3,500,000<br>(500,000 + 3,000,000) | = | හිමිකම් ප්‍රාග්ධනය<br>රු. 5,000,000<br>රඳවාගත් ලාභය<br>රු. 1,000,000<br>(3,000,000 – 2,000,000) |

**මනෝජ් විසින් රු. 200,000 ක මුදලක් තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා ගැනිලි සිදු කරන ලදී.**

## වත්කම් = හිමිකම්

| වත්කම් | | හිමිකම් |
|---|---|---|
| ගොඩනැගිල්ල රු. 2,500,000 | = | හිමිකම් ප්‍රාග්ධනය රු. 5,000,000 |
| තොගය රු. 0 | | රඳවාගත් ලාභය රු. 1,000,000 |
| මුදල් රු. 3,300,000 (3,500,000 – 200,000) | | (-) ගැනිලි (-) රු. 200,000 |

Sandeepa Jayasekera - JMC 25




JMC vLearning "your virtual learning partner"

## ITEC විසින් රු. 600,000 ක ණය මුදලක් ලබා ගන්නා ලදී.

**වත්කම් = හිමිකම් + වගකීම්**

| වත්කම් | | හිමිකම් | | වගකීම් |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල රු.2,500,000 | = | කොටස් ප්‍රාග්ධනය රු. 5,000,000 | + | ණය රු. 600,000 |
| මුදල් රු. 3,900,000 | | රඳවා ගත් ලාභය රු. 1,000,000 | | |
| | | (-) ගැනිලි (-) රු. 200,000 | | |



## ITEC විසින් රු. 1,000,000 ක පරිගණක ණය පදනමට මිලදී ගන්නා ලදී.

**තොගය = කොටස් + වගකීම්**

| වත්කම් | | හිමිකම් | | වගකීම් |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල රු. 2,500,000 | = | කොටස් ප්‍රාග්ධනය රු. 5,000,000 | + | ණය රු. 600,000 |
| තොගය රු. 1,000,000 | | රඳවා ගත් ලාභය රු. 1,000,000 | | ණයහිමි රු. 1,000,000 |
| මුදල් රු. 3,900,000 | | (-) ගැනිලි (-) රු. 200,000 | | |

### මනෝජ් විසින් රු. 500,000 ක අතිරේක ප්‍රාග්ධනයක් ITEC වෙත යොදවන ලදී.

| වත්කම් | = | කොටස් | + | වගකීම් |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල රු.2,500,000 | = | කොටස් ප්‍රාග්ධනය රු. 5,500,000 | + | ණය රු. 600,000 |
| තොගය රු. 1,000,000 | | රඳවා ගත් ලාභය රු. 1, 000,000 | | ණයහිමි රු. 1,000,000 |
| මුදල් රු. 4,400,000 (3,900,000 + 500,000) | | (-) ගැනිලි (-) රු. 200,000 | | |

Sandeepa Jayasekera - JMC 29

### ITEC විසින් රු. 400,000 ක් පිරිවැය වූ තොගයක් රු. 750,000 කට ණයට විකුණන ලදී.

| වත්කම් | = | කොටස් | + | වගකීම් |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල රු.2,500,000 | = | කොටස් ප්‍රාග්ධනය රු. 5,500,000 | + | ණයහිමි රු. 1,000,000 |
| තොග රු. 600,000 | | රඳවා ගත් ලාභය රු. 1,350,000 (1,000,000 + 350,000) | | ණය රු. 600,000 |
| ණයගැතියා රු. 750,000 | | (-) ගැනිලි (-) රු. 200,000 | | |
| මුදල් රු. 4,400,000 | | | | |

Sandeepa Jayasekera - JMC 30

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 01

මනුකගේ ව්‍යාපාරය තුල 2024 දෙසැම්බර් මාසයේ පහත ගණුදෙනු සිදු වී ඇත. එම ගණුදෙනුවක බලපෑම මූලික ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්න.

| ගණුදෙනුව | වත්කම් | = | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| 1. මනුක විසින් රු. 500,000 ක් ආයෝජනය කරමින් ව්‍යාපාරය ආරම්භ කරන ලදී. | | = | | |
| 2. ව්‍යාපාරය විසින් රු. 300,000 ක් වටිනා තොග මිලදී ගන්නා ලදී. | | = | | |
| 3. කාර්යාලයේ භාවිතය සඳහා රු. 50,000 ක උපකරණ මිලදී ගන්නා ලදී. | | = | | |
| 4. ලද කුලී ආදායම රු. 5,000 කි. | | | | |

| ගණුදෙනුව | වත්කම් | = | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| 5. රු. 700,000 ක අයිතම ණය පදනම මත මිලදී ගන්නා ලදී. | | = | | |
| 6. රු. 50,000 ක් පිරිවැය වූ තොගයක් රු. 75,000 කට විකුණන ලදී. | | = | | |
| 7. රු. 400,000 ක බැංකු ණයක් ලබා ගන්නා ලදී. | | = | | |
| 8. රු. 100,000 ක් පිරිවැය වූ තොගයක් රු. 250,000 ණයට විකුණන ලදී. | | = | | |
| 9. රු. 50,000 ක ස්ථාවර තැන්පතුවක් විවෘත කරන ලදී. | | = | | |
| 10. මනුක විසින් එය පුද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 10,000 ක මුදලක් ලබා ගන්නා ලදී. | | = | | |
| 11. මනුක විසින් රු. 20,000 පිරිවැය වූ තොග තම පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගන්නා ලදී. | | = | | |

JMC vLearning "your virtual learning partner"

| ගණුදෙනුව | වත්කම් | = | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| 12. මනුක විසින් රු. 200,000 ක අතිරේක ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට ආයෝජනය කරන ලදි. | | = | | |
| 13. සේවකයින් වෙත රු. 50,000 ක වැටුප් ගෙවන ලදි. | | = | | |
| 14. මාසයේ විදුලි බිල රු. 5,000 තවමත් ගෙවා නොමැත. | | = | | |
| 15. රු. 15,000 ක් වූ බැංකු ණය වාරිකය ගෙවා දමන ලදි. වාරිකයෙන් රු. 2,000 ක් පොළිය වේ. | | = | | |
| 16. ස්ථාවර තැන්පතුවෙන් ලද පොලී ආදායම රු. 1,000 කි. | | = | | |
| 17. ණයහිමියන්ට රු. 20,000 ක් ගෙවන ලදි. | | = | | |
| 18. ණයගැතියන්ගෙන් ලද මුදල රු. 30,000 කි. | | | | |

## ප්‍රශ්න 02

පහත ගණුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

| ගණුදෙනුව | වත්කම් | = | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| 1. අයිතිකරුවන් රු. 100,000 ක මුදල්ද ව්‍යාපාරය තුල ආයෝජනය කරන ලදි. | | = | | |
| 2. රු. 200,000 ක අයිතම ණයට ගන්නා ලදි. | | = | | |
| 3. රු. 8,000 ක් ණයහිමියන්ට ගෙවන ලදි. | | = | | |
| 4. රු. 8,000 ක් පිරිවැය වූ අයිතම රු. 10,000 ක් ණයට විකුණන ලදි. | | = | | |
| 5. අයිතිකරුවා ඔහුගේ පෞද්ගලික දුරකථන බිල රු. 1,000 ව්‍යාපාරයේ මුදලින් ගෙවා දමන ලදි. | | | | |

| ගණුදෙනුව | වත්කම් | = | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| 6) 12% පොලී අනුපාතයක් යටතේ රු. 100,000 ක ණය මුදලක් ලබා ගන්නා ලදී. | | | | |
| 7) අයිතිකරුවා සිය පුද්ගලික වාහනය ව්‍යාපාරයට ආයෝජනය කරන ලදී. එහි වටිනාකම රු. 200,000කි. | | = | | |
| 8) රු. 1,000 ක කුලිය ගෙවා දමන ලදී. | | = | | |
| 9) ණය පොලිය ගෙවන ලදී. | | = | | |
| 10) ණයගැතියන්ගෙන් ලද මුදල රු. 5,000 කි. | | = | | |

## 2020 ජනවාරි 1.4

| වත්කම් | = හිමිකම් | + වගකීම් |
|---|---|---|
| + 150,000 - 140,000 | = + 150,000 - 140,000 | |

පහත සදහන් ඒවා අතුරෙන් ඉහත ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත් නිවැරදි ගණුදෙනුව වන්නේ කුමක්ද?

1. පිරිවැය රු. 140,000 ක් වූ භාණ්ඩ රු. 150,000 කට විකුණන ලදී.
2. පිරිවැය රු. 150,000 ක් භාණ්ඩ රු. 140,000 කට විකුණන ලදී.
3. රු. 150,000 000 ක භාණ්ඩ ණය පදනම මත විකුණා රු. 140,000 ක මුදලක් එකතු කර ගන්නා ලදී.
4. රු. 150,000 ක භාණ්ඩ, ණය පදනම මත මිලදී ගෙන රු. 140,000 ක් ගෙවන ලදී.

## 2020 ජනවාරි 1.8

පහත ගණුදෙනු අතුරෙන් වත්කම් වැඩිවීමට බලපාන ගණුදෙනුවක් වන්නේ කුමක්ද?

1. ව්‍යාපාරයේ අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය ලෙස රු. මිලියන 1.5 ක මුදලක් ආයෝජනය කිරීම.
2. මාර්තු මාසයට අදාල රු. 75,000 ක ජල බිල්පත ගෙවා තිබීම.
3. වෙළඳ ණයගැතියෙකුගෙන් රු. 100,000 ක මුදලක් ලැබීම.
4. වෙළඳ ණයහිමියෙකුට රු. 125,000 ක මුදලක් පියවීම.



JMC vLearning
"your virtual learning partner"

## 2020 ජූලි 1.7

කේවලස්වාමී ව්‍යාපාරයක අයිතිකරු විසින් තම පුද්ගලික මෝටර් රථය තම ව්‍යාපාරයකට පැවරීම තුලින් ගිණුම්කරණ සමීකරණයට සමීකරණයට ඇති කරනු ලබන නිවැරදි බලපෑම, පහත සඳහන් ඒවා අතුරින් තෝරන්න.

1. හිමිකම් වැඩිවීම සහ වත්කම් අඩුවීම
2. වත්කම් වැඩිවීම සහ හිමිකම් අඩුවීම
3. වගකීම් වැඩිවීම සහ හිමිකම අඩුවීම
4. වත්කම් වැඩිවීම සහ හිමිකම් වැඩිවීම

## 2020 ජුලි 1.10

වත්කම් = හිමිකම් + වගකීම්

(200,000) = (200,000)

ඉහත සඳහන් ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත් නිවැරදි ගණුදෙනුව වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක්ද?

1. අයිතිකරු විසින් තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 200,000 ක් වටිනා භාණ්ඩ තබා ගැනීම.
2. අයිතිකරු විසින් රු. 200,000 ක අමතර මුදලක් ව්‍යාපාරයට යෙදවීම.
3. අයිතිකරු විසින් රු 200,000ක ව්‍යාපාරයේ විදුලි බිල තම පුද්ගලික මුදලින් පියවීම.
4. ණය පදනම මත නැවත විකිණීම සඳහා රු. 200,000 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම.



JMC vLearning "your virtual learning partner"

## 2020 ජනවාරි 1.5

පහත සඳහන් ගණුදෙනු අතුරෙන්, වත්කම් වැඩිවීම හේතු වන්නේ කුමක්ද?

1. නැවත විකිණීම සඳහා රු. 500,000 ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට ගැනීම.
2. රු. 50,000 විදුලි බිල්පතක් ගෙවීම.
3. කාර්යාලයේ භාවිතය සඳහා රු. 100,000 ක් වටිනා පරිගණකයක් ණයට මිලදී ගැනීම
4. ව්‍යාපාරයේ අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා පිරිවැය රු 100,000 ක් වූ භාණ්ඩ ලබාගෙන තිබීම.

## 2021 ජනවාරි 1.9

XYZ බැංකුවෙන් බැංකු ණයක් ලබාගැනීම හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම වනුයේ,

1. වත්කම් වැඩිවීම සහ හිමිකම් වැඩිවීම
2. වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම
3. වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම
4. හිමිකම අඩුවීම සහ වගකීම් වැඩිවීම

Sandeepa Jayasekera - JMC 41

## 2021 ජූලි 1.5

පහත සඳහන් ඒවා අතුරෙන් වත්කම් අඩුවීමට බලපාන ගණුදෙනුව තෝරන්න.

1. භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලොරි රථයක් රු. 1,500,000 කට ණයට මිලට ගැනීම.
2. වාණිජ බැංකුවකින් රු. 100,000 ණය මුදලක් ලබා ගැනීම.
3. නැවත විකිණීම සඳහා රු. 350,000 ක තොගයක් ණයට මිලට ගැනීම.
4. ණයහිමියෙකුට රු. 250,000 ක මුදලක් ගෙවීම.

Sandeepa Jayasekera - JMC 42

JMC vLearning "your virtual learning partner"

## 2022 ජනවාරි 1.5

රු. 300,000 ක් වටිනා කාර්යාල උපකරණ සහ මුදලින් රු. 500,000 ක් යොදවමින් සොයිසා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඉහත ගණුදෙනුව ගිණුම්කරණ සමීකරණය බලපාන නිවැරදි ආකාරය කුමක්ද?

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1) | + 500,000 | = | + 500,000 | | |
| 2) | + 800,000 | = | + 800,000 | | |
| 3) | + 800,000 | = | + 500,000 | | + 300,000 |
| 4) | + 200,000 | = | + 200,000 | | |



## 2022 ජනවාරි 1.7

වගකීම් වැඩිවීමට බලපාන ගණුදෙනුව වන්නේ,

1. මෝටර් රථයක් අත්පිට මුදලට මිලදී ගැනීම.
2. වෙළඳ නොග හිමියෙකුගේ ඉන්වොයිසිය පියවීම.
3. බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීම.
4. ණයට භාණ්ඩ විකිණීම.



JMC vLearning "your virtual learning partner"

## 2022 ජූලි 1.6

රන්මිර අමතර ප්‍රාග්ධනය වශයෙන් මුදලින් රු. 1000,000 ක් ඔහුගේ කේවලස්වාමී ව්‍යාපාරයේ ආයෝජනය කළේය. පහත සඳහන් ඒවා අතුරෙන් ඉහත ගණුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණය සිදු වූ නිවැරදි බලපෑම තෝරන්න.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1) | + 1,000,000 | = | | | + 1,000,000 |
| 2) | + 1,000,000 | = | + 1,000,000 | | |
| 3) | - 1,000,000 | = | - 1,000,000 | | |
| 4) | - 1,000,000 | = | | | - 1,000,000 |



## 2022 ජූලි 1.9

පහත සඳහන් ගණුදෙනු අතුරෙන් වත්කම් අඩුවීමට බලපාන ගණුදෙනුව වන්නේ කුමක්ද?

1. මුදලින් රු. 200,000 ක් ගෙවා කාර්යාලයේ පාවිච්චිය සඳහා පරිගණකයක් මිලදී ගැනීම.
2. ව්‍යාපාරයේ අයිතිකරු විසින් ඔහුගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 65,000 ක් පිරිවැය වූ භාණ්ඩ ගැනීම
3. ණයගැතියෙකුගෙන් රු. 100,000 ක මුදලක් එකතු කර ගැනීම.
4. රු. 250,000 ක් පිරිවැය වූ තොගයක් රු. 400,000 කට ණයට විකිණීම.



JMC vLearning "your virtual learning partner"

## 2023 ජනවාරි 1.4

කේවලස්වාමී ව්‍යාපාරයක් වන ජෝවන් ට්‍රේඩර්ස්, පිරිවැය රු. 750,000 ක් වූ රු. 1,000,000/- කට ණයට විකුණන ලදී. මෙම ගණුදෙනුව සම්බන්ධයෙන්, ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න.

| | වත්කම් | = | ප්‍රාග්ධනය (හිමිකම්) | + වගකීම් |
|---|---|---|---|---|
| (1) | - 1,000,000 | = | | - 1,000,000 |
| (2) | + 250,000 | = | + 250,000 | |
| (3) | + 1,000,000 | = | + 250,000 | + 750,000 |
| (4) | + 750,000 | = | | + 750,000 |



## 2023 ජූලි 1.5

අයිතිකරු විසින් මුදලින් කළ ගැනිලි හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම පහත සඳහන් ඒවා අතුරින් තෝරන්නී

1. වත්කම් වැඩිවීම සහ වගකීම් අඩුවීම
2. වත්කම් අඩුවීම සහ ස්කන්ධය අඩුවීම
3. වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම
4. වත්කම් අඩුවීම සහ ස්කන්ධය වැඩිවීම



JMC vLearning "your virtual learning partner"

## 2023 ජූලි 1.10

දනිදු විසින් රු. 1,500,000/- ක් වටිනා ලොරි රථයක් අමතර ප්‍රාග්ධනය වශයෙන් ව්‍යාපාරයට යොදවන ලදී. මෙම ගණුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න.

| | වත්කම් | = | ප්‍රාග්ධනය (හිමිකම්) | + වගකීම් |
|---|---|---|---|---|
| (1) | + 1,500,000 | = | | + 1,500,000 |
| (2) | - 1,500,000 | = | | - 1,500,000 |
| (3) | - 1,500,000 | = | - 1,500,000 | |
| (4) | + 1,500,000 | = | + 1,500,000 | |



## 2024 ජනවාරි 1.4

අරුණ ට්‍රේඩර්ස් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා රු. 500,000/- ක බැංකු ණයක් ලබා ගන්නා ලදී. පහත සඳහන් ඒවා අතුරෙන් මෙම ගණුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම තෝරන්න.

| | වත්කම් | = | ප්‍රාග්ධනය (හිමිකම්) | + වගකීම් |
|---|---|---|---|---|
| (1) | + 500,000 | = | + 500,000 | - |
| (2) | - 500,000 | = | - | - 500,000 |
| (3) | + 500,000 | = | - | + 500,000 |
| (4) | - 500,000 | = | - 500,000 | - |



JMC vLearning your virtual learning partner

## 2024 ජනවාරි 1.6

පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළඳ ණයගැතියෙකුගෙන් මුදල් ලැබීමත් හේතුවෙන් ගිණුම්කරණ මූලිකාංග මත වන නිවැරදි බලපෑම තෝරන්න.

(1) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම
(2) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය වැඩිවීම
(3) වත්කම් අඩුවීම සහ ස්කන්ධය අඩුවීම
(4) වත්කම්වල වෙනස්වීමක් සිදු නොවේ



## 2019 ජනවාරි 1.4

ණයහිමියෙකුට මුදලින් පියවීම නිසා ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම, පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න

1) වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම
2) වත්කම් අඩුවීම සහ වගකීම් වැඩිවීම
3) වගකීම් අඩුවීම ස්කන්ධය අඩුවීම
4) වගකීම් අඩුවීම සහ ස්කන්ධය වැඩිවීම



JMC vLearning "your virtual learning partner"

# 2019 ජනවාරි 5(b)

විජේසූරිය, 2018 සැප්තැම්බර් 01 දින කේවලස්වාමී ව්‍යාපාරයක් ආරම්භ කළේය. පහත සඳහන් ගණුදෙනු 2018 සැප්තැම්බර් මාසය සඳහා ඔහුගේ ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී.

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2018.09.01 | මුදලින් රු. 800,000/- ක් ආයෝජනය කරමින් විජේසූරිය ව්‍යාපාරය ආරම්භ කළේය. තවද, ඔහු රු. 1,500,000/- ක් වටිනා ඔහුගේ පෞද්ගලික වෑන් රථය ව්‍යාපාරයේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආයෝජනය කළේය. |
| 2018.09.05 | නැවත විකිණීමේ සඳහා රු. 625,000/- ක් වටිනා භාණ්ඩ ණයට මිලදී ගත්තේය. |



| | |
|---|---|
| 2018.09.18 | රු. 375,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, රු. 485,000/- කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2018.09.26 | රු. 125,000/- ක සේවක වැටුප් ගෙවන ලදී. |
| 2018.09.28 | විජේසූරිය විසින් ඔහුගේ පෞද්ගලික පරිහරණය සදහා රු. 35,000 ක මුදලක් ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලදී. |
| 2018.09.30 | ණයට ලබාගත් භාණ්ඩ වෙනුවෙන් ණයහිමියන්ට රු. 125,000/- ක් ගෙවන ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න

ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + මුදල් = ස්කන්ධය ( හිමිකම් ) + ( වගකීම් ) (ලකුණු 06)



JMC vLearning your virtual learning partner

# 2019 ජූලි 5 (a)

කේවලස්වාමී ව්‍යාපාරයක් වන සමන් ව්‍යාපාරයේ 2019 ජනවාරි පහත ගනුදෙනු සිදු විය

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2019-01-02 | නැවත විකිණීම සඳහා රු 723,000/-ක් වටිනා භාණ්ඩ ණයට මිලට ගන්නා ලදි |
| 2019-01-05 | අයිතිකරු වන සමන් පිරිවැය රු 50,000ක් වන භාණ්ඩ තම පුද්ගලික ප්‍රයෝජනයට ගන්නා ලදි |
| 2019-01-10 | පිරිවැය රු 575,000ක භාණ්ඩ රු 600,000කට ණයට විකුණන ලදි |
| 2019-01-15 | ණයගැතියෙකුගෙන් රු 550,000ක මුදලක් ලැබුණි |



JMC vLearning "your virtual learning partner"

# 2019 ජූලි 5 (a)

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2019-01-28 | 2019 ජනවාරි මාසයේ දුරකතන බිල රු 18,000ක් වූ අතර ඉන් රු 12,000ක් ගෙවන ලදි |
| 2019-01-30 | රු 500,000ක මෝටර් සයිකලයක් කාර්යාලයේ භාවිතය සඳහා අත්පිට මුදලට මිලට ගන්නා ලදි |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න

ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + මුදල් = ස්කන්ධය (හිමිකම්) + ( වගකීම් )

(ලකුණු 06)

# 2020 ජනවාරි 5 (a)

කේවලස්වාමි ව්‍යාපාරයක් වන ප්‍රනාන්දු ස්ටෝර්ස් හි පොත්වලින් පොත්වලින් 2019 මාර්තු මාසයට අදාල පහත සඳහන් ගණුදෙනු උපුටා ගන්නා ලදී

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2018.03.01 | නැවත විකිණීම සඳහා රු. 825,000/- ක් වටිනා භාණ්ඩ ණය පදනම මත මිලදී ගන්නා ලදී. |
| 2018.03.05 | පිරිවැය රු. 420,000/- ක් වූ භාණ්ඩ, රු. 525,000/- කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2018.03.15 | ප්‍රනාන්දු විසින් තම පෞද්ගලික වියදම් සඳහා රු. 75,000/- ක මුදලක් ලබා ගන්නා ලදී. |
| 2018.03.26 | ණය පදනම යටතේ මිලදී ගත් භාණ්ඩ සඳහා ණයහිමියන්ට රු. 95,000/- ක් ගෙවන ලදී. |
| 2018.03.30 | රු. 100,000/- ක කාර්යය මණ්ඩල වැටුප් ගෙවන ලදී. |
| 2018.03.31 | කාර්යාල ප්‍රයෝජනය සඳහා රු. 1,500,000/- ක් වටිනා ලී බඩු, ණය පදනම මත මිලදී ගන්නා ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ:
ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න

ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + මුදල් = ස්කන්ධය (හිමිකම්) + වගකීම් (ලකුණු 06)



# 2020 ජූලි 5 (a)

කේවලස්වාමි ව්‍යාපාරයක් වන සෑම් ස්ටෝර්ස් හි පොත්වලින් පොත්වලින් 2020 මාර්තු මාසයට අදාල පහත සඳහන් ගණුදෙනු උපුටා ගන්නා ලදී

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2020.03.02 | නැවත විකිණීම සඳහා රු 450,000/- වටිනා භාණ්ඩ ණය පදනම මත මිල ට ගන්නා ලදි |
| 2020.03.05 | රු 390,000/-ක් පිරිවැය වූ තොග රු 445,000/- මුදලකට ණයට විකුණන ලදි |
| 2020.03.10 | සෑම් විසින් රු 38,500/-ක් පිරිවැය වූ භාණ්ඩ තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා ගන්නා ලදි |
| 2020.03.15 | සේවක වේතන වශයෙන් රු 25,000ක් ගෙවන ලදි |
| 2020.03.15 | බැංකුවේ ස්ථාවර තැන්පතුවක රු 200,000ක මුදලක් ආයෝජනය කරන ලදි |

ඔබ විසින් කළ යුතු දෑ:
ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න

තොග + ණයගැතියෝ + ස්ථාවර තැන්පතු + මුදල් = ස්කන්ධය (හිමිකම්) + වගකීම් (ලකුණු 05)



JMC vLearning "your virtual learning partner"

# 2021 ජනවාරි 5 (a)

කේවලස්වාමි ව්‍යාපාරයක් වන රාජා ස්ටෝර්ස් හි පොත්වලින් පොත්වලින් 2021 ජනවාරි මාසයට අදාල පහත සඳහන් ගණුදෙනු උපුටා ගන්නා ලදී

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2021.01.01 | ප්‍රාග්ධනය ලෙස රු 2,000,000ක් යොදවමින් රාජා ව්‍යාපාරයක් ආරම්භ කළේය |
| 2021.01.05 | නැවත විකිණීම සඳහා රු 750,000ක් වටිනා භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදි |
| 2021.01.10 | රු 500,000ක් පිරිවැය වූ තොග රු 650,000කට ණයට විකුණන ලදි |
| 2021.01.15 | වෙළඳ ණයගැතියෙකුගෙන් රු 400,000ක් ලැබුණි |
| 2021.01.25 | 2021 ජනවාරි මාසයේ සේවක වැටුප් ලෙස රු 300,000ක් ගෙවන ලදි |
| 2021.01.31 | රු 25,000ක් පිරිවැය වූ භාණ්ඩ රාජා විසින් ඔහුගේ පෞද්ගලික භාවිතයට යොදා ගන්නා ලදි |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න

තොග + ණයගැතියෝ + මුදල් = ස්කන්ධය (හිමිකම්) + වගකීම් (ලකුණු 06)



# 2021 ජුලි 5

සෑම්, 2021 මාර්තු 01 දින සිල්ලර වෙළඳසැලක් ආරම්භ කරන ලදී. 2021 මාර්තු මාසය තුළදී පහත සඳහන් ගණුදෙනු සිදුවිය.

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2021.03.01 | මූලික ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 1,000,000/- ක් ආයෝජනය කරන ලදී. |
| 2021.03.02 | නැවත විකිණීම සඳහා රු. 800,000/- ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. |
| 2021.03.05 | රු. 50,000/- ක් වූ මාසික කඩ කුලිය ගෙවන ලදී. |
| 2021.03.10 | පිරිවැය රු. 500,000/- ක් වූ භාණ්ඩ, රු. 750,000/- කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2021.03.15 | රු. 150,000/- ක සේවක වැටුප් ගෙවීය. |
| 2021.03.31 | රු. 500,000/- බැංකු ණයක් ලබා ගන්නා ලදී. |

ඔබ වසන කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සඳහන් කරන්න. [තොගය + වෙළඳ ණයගැතියෝ + මුදල් = ස්කන්ධය + වගකීම්] (ලකුණු 05)



JMC vLearning "your virtual learning partner"

## 2022 ජනවාරි 3

කේවලස්වාමි ව්‍යාපාරයක පහත දැක්වෙන ගණුදෙනු පහ (5) මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම ඔබට දී ඇත.

| | වත්කම් | | | = | ස්කන්ධය | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | තොගය | වෙළඳ ණයගැතියෝ | මුදල් | | (ප්‍රාග්ධනය) | | වෙළඳ ණයහිමියෝ |
| (1) | | | + 1,000,000 | = | + 1,000,000 | | |
| (2) | + 600,000 | | | = | | | + 600,000 |
| (3) | (500,000) | + 600,000 | | = | + 100,000 | | |
| (4) | | | (400,000) | = | | | (400,000) |
| (5) | | | (50,000) | = | (50,000) | | |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගණුදෙනුව හඳුනා දක්වන්න. (ලකුණු 05)



## 2022 ජූලි 2

කේවලස්වාමි ව්‍යාපාරයක පහත දැක්වෙන ගණුදෙනු පහ (5) මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම ඔබට දී ඇත.

| | වත්කම් | | | | = | ස්කන්ධය | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල උපකරණ | තොගය | වෙළඳ ණයගැතියෝ | මුදල් | | (ප්‍රාග්ධනය) | | |
| (1) | | | | + 1,200,000 | = | + 1,200,000 | | |
| (2) | | + 150,000 | | (150,000) | = | | | |
| (3) | | | | (50,000) | = | (50,000) | | |
| (4) | | (65,000) | + 80,000 | | = | + 15,000 | | |
| (5) | + 100,000 | | | | = | | | + 100,000 |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගණුදෙනුව හඳුනා දක්වන්න. (ලකුණු 05)



JMC vLearning "your virtual learning partner"

## 2023 ජනවාරි 3

කේවලස්වාමි ව්‍යාපාරයක පහත දැක්වෙන ගණුදෙනු පහ (5) මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම ඔබට දී ඇත.

| | වත්කම් | | | | = | ස්කන්ධය (ප්‍රාග්ධනය) | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල උපකරණ | තොගය | වෙළඳ ණයගැතියෝ | මුදල් | | | | |
| (1) | | | | + 2,000,000 | = | + 2,000,000 | | |
| (2) | | + 750,000 | | (150,000) | = | | | + 600,000 |
| (3) | + 300,000 | | | | = | | | + 300,000 |
| (4) | | | | (450,000) | = | | | (450,000) |
| (5) | | (150,000) | + 180,000 | | = | + 35,000 | | |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගණුදෙනුව හඳුනා දක්වන්න. (ලකුණු 05)



## 2023 ජූලි 5

කේවලස්වාමි ව්‍යාපාරයක පහත දැක්වෙන ගණුදෙනු පහ (5) මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම ඔබට දී ඇත.

| | වත්කම් | | | | = | ස්කන්ධය (ප්‍රාග්ධනය) | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|---|
| | ලොරි | තොගය | වෙළඳ ණයගැතියෝ | මුදල් | | | | |
| (1) | + 750,000 | | | + 1,250,000 | = | + 2,000,000 | | |
| (2) | | + 950,000 | | | = | | | + 950,000 |
| (3) | | (60,000) | + 90,000 | | = | + 30,000 | | |
| (4) | | | | (150,000) | = | (150,000) | | |
| (5) | | | | (200,000) | = | | | (200,000) |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගණුදෙනුව හඳුනා දක්වන්න. (ලකුණු 05)



JMC vLearning "your virtual learning partner"

# 2024 ජනවාරි 5


දුනිත්, 2023 දෙසැම්බර් 01 වන දින අවන්හලක් ආරම්භ කළේය 2023 දෙසැම්බර් මාසය තුල දී දුනිත්ගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදු විය

1) දුනිත් රු 2,000,000ක ආරම්භක ප්‍රාග්ධනයක් යෙද වූ අතර, එය මුදලින් රු 1,200,000ක් සහ රු 800,000ක් වටිනා කාර්යාල උපකරණ වලින් සමන්විත විය
2) නැවත විකිණීම සඳහා රු 650,000ක් වටිනා භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදි
3) රු 260,000ක් වූ පේස්ට්‍රි අයිතම රු 350,000කට අත්පිට විකුණා දමන ලදි
4) මාසය සඳහා දුනිත් විසින් සිදුකළ මුදල් ගැනිලි රු 250,000කි
5) මාසයේ සේවක වැටුප් ලෙස රු 200,000ක් ගෙවන ලදි

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සඳහන් කරන්න. [කාර්යාල උපකරණ + තොගය + මුදල් = ස්කන්ධය + වගකීම්] (ලකුණු 05)






JMC vLearning
"your virtual learning partner"







JMC vLearning
"your virtual learning partner"








JMC vLearning
"your virtual learning partner"





JMC vLearning
"your virtual learning partner"

# 2024 ජනවාරි ප්‍රශ්න අංක1.11

1.11 සිට පහත සඳහන් එක් එක් ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

වත්කම්වල අඩුවීමක් හෝ වගකීම් වැඩි වීමක් නිසා කොටස්වල අඩුවීමක් ඇති වන අතර, එම ව්‍යාපාරයේ අයිතිකරුවන්ට එම බෙදාහැරීම් හැර වෙනත් වියදම් ලෙස අර්ථ දැක්විය හැක.






JMC vLearning "your virtual learning partner"

## විස්තරාත්මක ගිණුම්කරණ සමීකරණය

හිමිකමට ලාභය එකතු කරලා මූලික ගිණුම්කරණ සමීකරණය ප්‍රසාරණය කරන්න පුළුවන්. එහෙම පුළුල් කරන ගිණුම්කරන සමීකරණයට අපි විස්තරාත්මක ගිණුම්කරන සමීකරණය කියලා කියනවා

වත්කම් = හිමිකම් + ලාභය + වගකීම්

වත්කම් = හිමිකම් + ආදායම් − වියදම් + වගකීම්

**වත්කම් + වියදම් = හිමිකම් + ආදායම් + වගකීම්**



JMC vLearning "your virtual learning partner"

## 2021 ජනවාරි ප්‍රශ්න අංක1.13

පහත සඳහන් එක් එක් ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

1.13 තනි පුද්ගල ව්‍යාපාරයක හිමිකරු විසින් හඳුන්වා දෙන ලද අතිරේක ප්‍රාග්ධනය ව්‍යාපාරයේ කාලසීමාව සඳහා ලාභ/අලාභයට බලපායි.

# ප්‍රශ්න 01

මනුකගේ ව්‍යාපාරය තුල 2024 දෙසැම්බර් මාසයේ පහත ගණුදෙනු සිදු වී ඇත. එම ගණුදෙනුවක බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්න.

| ගණුදෙනුව | වත්කම් | වියදම් | = | හිමිකම් | ආදායම් | වගකීම් |
|---|---|---|---|---|---|---|
| 1. මනුක විසින් රු. 500,000 ක් ආයෝජනය කරමින් ව්‍යාපාරය ආරම්භ කරන ලදි. | | | = | | | |
| 2. ව්‍යාපාරය විසින් රු. 300,000 ක් වටිනා තොග මිලදී ගන්නා ලදි. | | | = | | | |
| 3. කාර්යාලයේ භාවිතය සඳහා රු. 50,000 ක උපකරණ මිලදී ගන්නා ලදි. | | | = | | | |
| 4. ලද කුලී ආදායම රු. 5,000 කි. | | | | | | |

| ගණුදෙනුව | වත්කම් | වියදම් | = | හිමිකම් | ආදායම් | වගකීම් |
|---|---|---|---|---|---|---|
| 5. රු. 700,000 ක අයිතම ණය පදනම මත මිලදී ගන්නා ලදි. | | | = | | | |
| 6. රු. 50,000 ක් පිරිවැය වූ තොගයක් රු. 75,000 කට විකුණන ලදි. | | | = | | | |
| 7. රු. 400,000 ක බැංකු ණයක් ලබා ගන්නා ලදි. | | | = | | | |
| 8. රු. 100,000 ක් පිරිවැය වූ තොගයක් රු. 250,000 ණයට විකුණන ලදි. | | | = | | | |
| 9. රු. 50,000 ක ස්ථාවර තැන්පතුවක් විවෘත කරන ලදි. | | | = | | | |

JMC vLearning "your virtual learning partner"

| ගණුදෙනුව | වත්කම් | වියදම් | = | හිමිකම් | ආදායම් | වගකීම් |
|---|---|---|---|---|---|---|
| 10. මනුක විසින් එය පුද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 10,000 ක මුදලක් ලබා ගන්නා ලදි. | | | = | | | |
| 11. මනුක විසින් රු. 20,000 පිරිවැය වූ තොග තම පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගන්නා ලදි. | | | = | | | |
| 12. මනුක විසින් රු. 200,000 ක අතිරේක ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට ආයෝජනය කරන ලදි. | | | = | | | |
| 13. සේවකයින් වෙත රු. 50,000 ක වැටුප් ගෙවන ලදි. | | | = | | | |
| 14. මාසයේ විදුලි බිල රු. 5,000 තවමත් ගෙවා නොමැත. | | | = | | | |

| ගණුදෙනුව | වත්කම් | වියදම් | = | හිමිකම් | ආදායම් | වගකීම් |
|---|---|---|---|---|---|---|
| 15. රු. 15,000 ක් වූ බැංකු ණය වාරිකය ගෙවා දමන ලදි. වාරිකයෙන් රු. 2,000 ක් පොළිය වේ. | | | = | | | |
| 16. ස්ථාවර තැන්පතුවෙන් ලද පොලී ආදායම රු. 1,000 කි. | | | | = | | |
| 17. ණයහිමියන්ට රු. 20,000 ක් ගෙවන ලදි. | | | | = | | |
| 18. ණයගැතියන්ගෙන් ලද මුදල රු. 30,000 කි. | | | | | | |

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 02

කේසරගේ ව්‍යාපාරයේ පහත ගණුදෙනු පුළුල් කල ගිණුම්කරණ සමීකරණය තුල දක්වන්න.

1. රු. 150,000 ක් ආයෝජනය කරමින් ව්‍යාපාරය ආරම්භ කරන ලදී.
2. මුදලට ගැණුම් සහ ණයට ගැණුම් පිළිවෙලින් රු. 10,000 ක් සහ රු. 15,000 ක් විය.
3. කාලච්ඡේදයේ විදුලිය වියදම රු. 10,000 ක් වූ අතර ඉන් රු. 6,000 ක් පමණක් ගෙවා ඇත.
4. කාලච්ඡේදයේ කුලිය රු. 5,000 කි. ඊළග වසරේ කුලියත් සමග රු. 6,000ක් කුළිය ලෙස ගෙවා ඇත
5. පිරිවැය රු. 10,000 ක් වූ තොග රු. 15,000 කට ණයට විකුණා ඇත.
6. අයිතිකරුවා විසින් රු. 2,500 ක තොග තම පුද්ගලික භාවිතයට ගෙන ඇත.
7. රු. 12,000 ක් පිරිවැය වූ අයිතම රු. 20,000 කට විකුණා ඇත.
8. ණයගැතියෙකුගෙන් රු. 10,000 ක් අයකරගත් අතර ඔහුට ලබාදුන් වට්ටම රු. 2,000 කි.
9. ණයහිමියාට පියවූ මුදල රු. 15,000 කි. ලද වට්ටම රු. 1,000 කි.

## Q2

| | වත්කම් | වියදම් | = | හිමිකම් | ආදායම් | වගකීම් |
|---|---|---|---|---|---|---|
| 1 | | | = | | | |
| 2 | | | = | | | |
| 3 | | | = | | | |
| 4 | | | = | | | |
| 5 | | | = | | | |
| 6 | | | = | | | |
| 7 | | | = | | | |
| 8 | | | = | | | |
| 9 | | | = | | | |
| 10 | | | = | | | |

JMC vLearning "your virtual learning partner"


# ලාභ සමීකරණය





ලාභය = ආදායම − වියදම

අපි දැනටමත් දන්නවා ලාභය ගණනය කරන්නේ ආදායමින් වියදම අඩු කරලා කියන එක.
මේ ලාභය අන්තිමට අපි අයිතිකාරයොන්ට ගෙවන්න ඕනි නිසා හිමිකමට එකතු කරනවා.
ආරම්භයේ තියෙන හිමිකමයි අවසානයේ තියෙන හිමිකමේ තියෙන වෙනසිනුත් ලාභය හොයාගන්න පුළුවන්.
මේ ක්‍රමේට කියනවා **ලාභ සමීකරණය** කියලා.



JMC vLearning
"your virtual learning partner"

## ලාභ සමීකරණය

අවසාන හිමිකම = ආරම්භක හිමිකම් + ලාභය − ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය

ලාභය = අවසාන හිමිකම − ආරම්භක හිමිකම + ගැනිලි − අතිරේක ප්‍රාග්ධනය



## 2019 ජූලි ප්‍රශ්න අංක1.4

පහත සඳහන් දේවලින්, ව්‍යාපාරයක ලාභය ගණනය කිරීමේ නිවැරදි සමීකරණය වන්නේ:

1) අවසාන හිමිකම - ආරම්භක හිමිකම් + ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය.

2) අවසාන හිමිකම - ආරම්භක හිමිකම් + ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය.

3) ආරම්භක හිමිකම් - අවසාන හිමිකම - ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය.

4) ආරම්භක හිමිකම් + අවසාන හිමිකම - ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය.



JMC vLearning "your virtual learning partner"

## 2023 ජූලි ප්‍රශ්න අංක1.2

ආයතනයක ලාභය/(අලාභය) ගණනය කිරීමට භාවිතා කළ හැකි නිවැරදි සමීකරණය පහතින් තෝරන්න:

(1) ලාභය/(අලාභය) = ආරම්භක හිමිකම් - අවසාන හිමිකම.
(2) ලාභය/(අලාභය) = අවසාන හිමිකම - ආරම්භක හිමිකම් - අතිරේක ප්‍රාග්ධනය + ගැනිලි
(3) ලාභය/(අලාභය) = අවසාන හිමිකම - ආරම්භක හිමිකම් - ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය.
(4) ලාභය/(අලාභය) = ආරම්භක හිමිකම් - අවසාන හිමිකම - අතිරේක ප්‍රාග්ධනය + ගැනිලි

Sandeepa Jayasekera - JMC 87

JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න 03

පහත ව්‍යාපාරවල ලාභය ලාභ සමීකරණය භාවිතා කර ගණනය කරන්න.

| ව්‍යාපාරය | අවසාන හිමිකම | ආරම්භක හිමිකම | ගැනිලි | අතිරේක ප්‍රාග්ධනය |
|---|---|---|---|---|
| ABC | 150,000 | 100,000 | - | - |
| XYZ | 165,000 | 95,000 | 5,000 | - |
| PQR | 295,500 | 154,500 | 16,000 | 10,000 |
| MNO | 135,000 | 175,000 | 15,000 | 20,000 |

| | ලාභය | = | අවසාන හිමිකම | − | ආරම්භක හිමිකම් | + | ගැනිලි | − | අතිරේක ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ABC | | = | | − | | + | | − | |
| XYZ | | = | | − | | + | | − | |
| PQR | | = | | − | | + | | − | |
| MNO | | = | | − | | + | | − | |

89

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න 04

පහත තොරතුරු භාවිතා කර 20X4/03/31න් අවසන් වර්ෂය සඳහා ලාභය ගණනය කරන්න.

| | |
|---|---|
| 20X4/03/31 දිනට මුළු වත්කම් | 4,500 |
| 20X4/03/31 දිනට මුළු වගකීම් | 1,300 |
| ගැනිලි | 500 |
| 201X/04/01 දිනට මුළු හිමිකම | 2,400 |
| අතිරේක ප්‍රාග්ධනය | 1,000 |

## 04

ලාභය = අවසාන හිමිකම − ආරම්භක හිමිකම + ගැනිලි − අතිරේක ප්‍රාග්ධනය

  =   −   +   −  

91

## ප්‍රශ්න 04

පහත තොරතුරු භාවිතා කර 20X4/03/31න් අවසන් වර්ෂය සඳහා ලාභය ගණනය කරන්න.

| විස්තරය | 20X4/04/01 දිනට ශේෂය | 20X5/03/31 දිනට ශේෂය |
|---|---|---|
| ජංගම වත්කම් | 95,000 | 182,000 |
| ජංගම වගකීම් | 72,500 | 88,000 |
| ජංගම නොවන වත්කම් | 135,000 | 200,000 |
| ජංගම නොවන වගකීම් | 60,000 | 120,000 |
| වර්ෂයේ ගැනිලි | | 5,000 |
| අතිරේක ප්‍රාග්ධනය | | 90,000 |

JMC vLearning
"your virtual learning partner"

# ආරම්භක සහ අවසාන හිමිකම්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මුළු වත්කම් | = | ජංගම වත්කම් | ජංගම නොවන වත්කම් | - | ජංගම වගකීම් | | ජංගම නොවන වගකීම් |
| ආරම්භක හිමිකම් | = | | | - | | | |
| අවසාන හිමිකම් | = | | | - | | | |

93

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ලාභය | = | අවසාන හිමිකම | - | ආරම්භක හිමිකම | + | ගැනිලි | - | අතිරේක ප්‍රාග්ධනය |
| | = | | - | | + | | - | |

94

IMC vLearning
your virtual learning partner"

## 2019 ජනවාරි ප්‍රශ්න අංක 1.6

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුන් ලංකා ට්‍රේඩර්ස් හි පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 750,000 |
| වසර තුළ හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 50,000 |
| 2018 මාර්තු 31 වන දිනට වගකීම් | 75,000 |
| 2018 මාර්තු 31 දිනට මුළු වත්කම් | 987,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වනුයේ

(1) රු.112,000/-. (2) රු.237,000/-. (3) රු.187,000/-. (4) රු.162,000/-.



## 2019 ජූලි ප්‍රශ්න අංක1.12

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සුපර් ට්‍රේඩර්ස් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | |
|---|---|
| 2019 මාර්තු 31 දිනට මුළු වත්කම් | 950,000 |
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 400,000 |
| වසර සඳහා ලාභය | 150,000 |
| වසර තුළ හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 100,000 |
| වර්ෂය තුළ කරන ලද ගැනිලි | 75,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2019 මාර්තු 31 දිනට මුළු වගකීම් ගණනය කරන්න



JMC vLearning "your virtual learning partner"

## 2020 ජනවාරි ප්‍රශ්න අංක1.5

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සරසි ට්‍රේඩර්ස් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | |
|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට ශුද්ධ වත්කම් | 975,000 |
| 2019 මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් | 1,350,000 |
| වසර තුළ හිමිකරු විසින් හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 500,000 |
| වසර තුළ හිමිකරු විසින් කරන ලද ගැනිලි | 350,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වූයේ:

1) රු.525,000/-. (2) රු.225,000/-. (3) රු.1,475,000/-. (4) රු.375,000/-.



## 2020 ජූලි ප්‍රශ්න අංක 1.6

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා තනි පුද්ගල ව්‍යාපාරයක් වන රුවන් ට්‍රේඩර්ස් හි වාර්තා වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | |
|---|---|
| 2020 මාර්තු 31 දිනට මුළු වත්කම් | 1,550,000 |
| 2020 මාර්තු 31 වන දිනට වගකීම් | 750,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | 280,000 |
| වර්ෂය තුළ ගැනිලි | 150,000 |

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපාරය සඳහා ලාභය

(1) රු.670,000/-. (2) රු.800,000/-. (3) රු.370,000/-. (4) රු.930,000/-.



JMC vLearning "your virtual learning partner"

## 2021 ජනවාරි ප්‍රශ්න අංක 1.18

තනි පුද්ගල ව්‍යාපාරයක් වන ජයවීරගේ ව්‍යාපාරයේ පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි

| | |
|---|---|
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 500,000 |
| 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ කරන ලද ගැනිලි | 100,000 |
| 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 200,000 |
| 2020 මාර්තු 31 වන දිනට වගකීම් | 150,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2020 මාර්තු 31 දිනට මුළු වත්කම් ගණනය කරන්න.



JMC vLearning "your virtual learning partner"

## 2021 ජූලි ප්‍රශ්න අංක1.4

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා නයනාගේ ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත ගනුදෙනු උපුටා ගන්නා ලදී:

| | |
|---|---|
| 2020 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | 1,800,000 |
| වර්ෂය තුළ කරන ලද ගැනිලි | 175,000 |
| අයිතිකරු විසින් ව්‍යාපාරයට මාරු කරන ලද පුද්ගලික වාහනය | 1,000,000 |
| 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 490,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2021 මාර්තු 31 වන දිනට කොටස් හිමිකම වන්නේ :
(1) රු.3,465,000/-. (2) රු.3,115,000/-. (3) රු.2,465,000/-.
(4) රු.2,115,000/-.

## 2022 ජනවාරි ප්‍රශ්න අංක1.4

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා තනි පුද්ගල ව්‍යාපාරයක් වන නවීන් ට්‍රේඩර්ස් හි පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී :

| | |
|---|---|
| 2021 මාර්තු 31 දිනට මුළු වත්කම් | 2,400,000 |
| 2020 අප්‍රේල් 01 වන දිනට ප්‍රාග්ධනය | 1,500,000 |
| වර්ෂය තුළ කරන ලද ගැනිලි | 200,000 |
| 2021 මාර්තු 31 වන දිනට වගකීම් | 900,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වන්නේ :
(1) රු.2,200,000/-. (2) රු.1,800,000/-. (3) රු.700,000/-. (4) රු.200,000/-.



## 2022 ජූලි ප්‍රශ්න අංක1.8

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා තනි පුද්ගල ව්‍යාපාරයක් වන Rose Traders හි පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී :

| | |
|---|---|
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 2,000,000 |
| වසර තුළ හිමිකරු විසින් කරන ලද ගැනිලි | 300,000 |
| 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 480,000 |
| 2022 මාර්තු 31 වන දිනට වගකීම් | 600,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2022 මාර්තු 31 දිනට මුළු වත්කම් වන්නේ :
(1) රු.2,180,000/-. (2) රු.2,600,000/-. (3) රු.2,780,000/-.
(4) රු.3,380,000/-.



JMC vLearning "your virtual learning partner"

## 2023 ජනවාරි ප්‍රශ්න අංක1.9

පහත තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා තනි පුද්ගල සමාගමක් වන මානෙල් ස්ටෝර්ස් හි පොත් වලින් උපුටා ගන්නා ලදී :

| | |
|---|---|
| 2022 මාර්තු 31 දිනට මුළු වත්කම් | 7,500,000 |
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 5,000,000 |
| වර්ෂය තුළ කරන ලද ගැනිලි | 600,000 |
| 2022 මාර්තු 31 වන දිනට වගකීම් | 1,700,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වනුයේ :

(1) රු.1,400,000/-. (2) රු.200,000/-. (3) රු.1,900,000/-. (4) රු.600,000/-.



## 2023 ජූලි ප්‍රශ්න අංක1.4

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා තනි පුද්ගල ව්‍යාපාරයක් වන Ram Traders හි පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී. :

| | |
|---|---|
| 2023 මාර්තු 31 දිනට මුළු වත්කම් | 8,400,000 |
| 2022 අප්‍රේල් 01 වන දිනට ප්‍රාග්ධනය | 2,000,000 |
| වසර තුළ හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 1,000,000 |
| වර්ෂය තුළ සාදන ලද ගැනිලි | 500,000 |
| වසර සඳහා ලාභය | 2,400,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2023 මාර්තු 31 දිනට කොටස් (ප්‍රාග්ධනය) :

(1) රු.3,000,000 (2) රු.3,500,000 (3) රු.4,400,000 (4) රු.4,900,000



JMC vLearning "your virtual learning partner"

# 2024 ජනවාරි ප්‍රශ්න අංක 1.8

පහත තොරතුරු 2024 ජනවාරි මාසය සඳහා සමීර් ට්‍රේඩර්ස්ගේ පොත් වලින් උපුටා ගන්නා ලදී :

| | |
|---|---|
| 2024 ජනවාරි 31 දිනට ශුද්ධ වත්කම් | 4,500,000 |
| 2024 ජනවාරි 01 දිනට ශුද්ධ වත්කම් | 3,700,000 |
| මාසය තුළ කරන ලද ගැනිලි | 200,000 |
| මාසය තුළ හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 300,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2024 ජනවාරි 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ව්‍යාපාරයේ ලාභය විය.

1) රු.700,000/- (2) රු. 800,000/- (3) රු.900,000/- (4) රු. 1,100,000/-






JMC vLearning
"your virtual learning partner"